# වැවිලි හා ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යාංශය

# පොල් වගාකිරීමේ මණ්ඩලය

# තනතුරු පුරප්පාඩු

## පොල් වගාකිරීමේ මණ්ඩලය පහත සඳහන් තනතුරු පුරප්පාඩු සඳහා ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ

**තනතුර : නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (ව්‍යාප්ති හා සංවර්ධන)**
**සේවා ස්ථානය : ප්‍රධාන කාර්යාලය - තනතුරු - 01**

**සුදුසුකම් හා පළපුරුද්ද :**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් කෘෂිකර්මය පිළිබඳ විශේෂ උපාධියක් සමග කෘෂිකර්ම විද්‍යාව / කෘෂිකර්ම ව්‍යාප්තිය පිළිබඳ පශ්චාත් උපාධිධාරියෙකු වීම / කෘෂිකර්ම ක්ෂේත්‍රයේ පිළිගත් වරලත් වෘත්තීය ආයතනයක ආශ්‍රිත සාමාජිකත්වය ලබා තිබීම

සමග

පිළිගත් ආයතනයක වසර 15 ක අදාළ ක්ෂේත්‍රයේ කළමනාකාර (Managerial) මට්ටමේ සේවා පළපුරුද්දක් ලබා තිබීම.

**වැටුප් කාණ්ඩය** : HM 1-1

**වැටුප් පරිමාණය** : රු. 140,640/- (4,100 x 15) 202,140/-

**01/2025 චක්‍රලේඛ ප්‍රකාරව වැටුප් ගෙවීම් කරන ආකාරය**

| 2025 වර්ෂයට | 2026 වර්ෂයට | 2027 වර්ෂයට |
|---|---|---|
| රු. 105,399/- | රු. 123,019/- | රු. 140,640/- |

**වයස :**

අවු. 35 නොඅඩු හා අවු. 55 ට නොවැඩි විය යුතුයි. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව අදාළ නොවේ.

**බඳවා ගැනීමේ ක්‍රමවේදය :**

ලිඛිත තරග විභාගයක හා / හෝ පත්වීම් බලධාරියා විසින් පත් කරනු ලබන මණ්ඩලයක් මගින් පැවැත්වෙන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත බඳවා ගනු ලැබේ.

**තනතුර : පොල් සංවර්ධන නිලධාරී III ශ්‍රේණිය**
**සේවා ස්ථානය : සේවා අවශ්‍යතාවය අනුව දිවයින පුරා - තනතුරු - 20**

**සුදුසුකම් හා පළපුරුද්ද :**

තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් කාර්මික / වෘත්තීය ආයතනයකින් කෘෂිකර්ම ක්ෂේත්‍රයට අදාළව ජාතික වෘත්තීය කුසලතා (N.V.Q.) පහ (05) මට්ටම හෝ ඊට ඉහළ මට්ටමක ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

**වැටුප් කාණ්ඩය** : MA 2-3

**වැටුප් පරිමාණය** : රු. 52,700/- (800 x 10) (1,190x11) (1,320 x 10) (1,350 x 10) 100,490/-

**01/2025 චක්‍රලේඛ ප්‍රකාරව වැටුප් ගෙවීම් කරන ආකාරය**

| 2025 වර්ෂයට | 2026 වර්ෂයට | 2027 වර්ෂයට |
|---|---|---|
| රු. 44,867/- | රු. 48,784/- | රු. 52,700/- |

**වයස :**

අවු. 18 නොඅඩු හා අවු. 45 ට නොවැඩි විය යුතුයි. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව අදාළ නොවේ.

**බඳවා ගැනීමේ ක්‍රමවේදය :**

ලිඛිත තරග විභාගයක හා / හෝ පත්වීම් බලධාරියා විසින් පත් කරනු ලබන මණ්ඩලයක් මගින් පැවැත්වෙන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත බඳවා ගනු ලැබේ.

(උක්ත තනතුරු සඳහා ජීවන වියම් දීමනාව රු. 17,800/- ඇතුළු තනතුරට අදාළ රජයේ අනෙකුත් දීමනා හිමි වේ)

**වෙනත් කොන්දේසි :**

**සෑම ඉල්ලුම්කරුවෙක්ම,**

I. ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.

II. තනතුරට පැවරෙන කාර්යයන් මැනවින් ඉටු කිරීම සඳහා මෙන්ම දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම සඳහා අවශ්‍ය වන කායික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.

III. විශිෂ්ට චරිතයෙන් යුක්ත විය යුතුය.

**අයදුම්පත් :**

- ඒ අනුව 2025.10.10 දිනට අදාළ සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් පහත වෙබ් අඩවියේ ඇති ආදර්ශ ආකෘතියට අනුව හෝ තමන් විසින් සකස් කර ගත් සුදුසු ආකෘතියක් භාවිතා කර අයදුම්පත් යොමුකළ යුතුවේ. එමෙන්ම අධ්‍යාපන සුදුසුකම්, වෘත්තීය සුදුසුකම් සහ පළපුරුද්ද පිළිබඳ විස්තර ඇතුළත් කර එම සුදුසුකම් සනාථ කළ හැකි සහතිකවල සහතික කළ පිටපත් සමග අයදුම්පත් ඉදිරිපත් කළ යුතුය. එසේ යොමු නොකරන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. තවද දැනටමත් රජයේ / සංස්ථා / මණ්ඩලවල සේවයේ යෙදී සිටින අයදුම්කරුවන් තම අයදුම්පත් ආයතන ප්‍රධානීන් මගින් එවිය යුතුය.
- අයදුම්පත් බහා එවන ලිපි කවරයේ ඉහළ වම් කෙළවරේ අදාළ තනතුර සඳහන් කළ යුතුය. එසේ ඉල්ලුම් කරන තනතුර සඳහන් කර නොමැති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.
- තනතුරු කිහිපයකට ඉල්ලුම් කරන්නේ නම් එක තනතුරටක එක බැගින් වන සේ අයදුම්පත්‍ර වෙන් වෙන්ව ඉදිරිපත් කළ යුතුවේ.
- සියලුම අයදුම්පත් 2025.10.10 දින හෝ එදිනට පෙර ලැබෙන සේ "සභාපති, පොල් වගාකිරීමේ මණ්ඩලය, 9/428, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් හෝ අතින් ගෙනවිත් භාර දිය යුතුය. ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

මෙහි සඳහන් නොවන යම් කරුණක් වේනොත්, ඒ සම්බන්ධව අදාළ බඳවා ගැනීමේ බලධාරියා විසින් තීරණය කරනු ඇත. මෙම තනතුර සම්බන්ධයෙන් කරනු ලබන පෞද්ගලික විමසීම් ඒ සඳහා නුසුදුසුකමක් සේ සලකා කටයුතු කරනු ලැබේ.

**සභාපති,**
**පොල් වගාකිරීමේ මණ්ඩලය,**
**9/428, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,**
**බත්තරමුල්ල.**

ඉහත තනතුරු සඳහා අදාළ අයදුම්පත්‍රය පහත වෙබ් අඩවියෙන් බාගත කර ගන්නා ලෙස දන්වමි. එමෙන්ම එසේ බාගත කරගැනීමේ යම් අපහසුතාවයක් ඇති වුවහොත් තමන් විසින් සකස් කර ගත් ආකෘතියක් භාවිතා කර අයදුම්පත් යොමු කරන ලෙස දන්වමි.

https://coconutsrilanka.lk/

tamilguru.lk